# 2 ලූක් ශුභාරංචියේ පසුබිම

දක්ෂ කතුවරයෙකු තමන්ගේ අරමුණු නැතිනම් පරමාර්ථ ඉටු කරගැනීම සඳහා අවැසි දත්ත හා සිද්ධි තාර්කික ලෙස ගොනු කරයි. සාමාන්‍යයෙන් එවැනි කෘතියක් සාර්ථක නිර්මාණයක් ලෙස පිළිගනු ලබයි. දක්ෂ කතුවරයෙකු ලෙස ශුද්ධ වූ ලූක් තුමා ද තම පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා ශුභාරංචිය රචනා කිරීමේ දී කටයුතු කර ඇත.

සියලු ජාතීන්ගේ ගැලවීම ගැන කතා කරන එතුමා එම අදහස ඉටු කර ගැනීම සඳහා තෝරා ගත් කරුණු ඉතා දක්ෂ හා නිර්මාණශීලි ලෙස ඉදිරිපත් කර ඇති බව ශුභාරංචිය දෙස බැලීමේ දී පැහැදිලි වේ.

ජේසුස් වහන්සේ ලබා දුන් ගැලවීම තෝරා ගත් ජනතාව වූ ජුදා ජාතියට පමණක් නොව මුළු මිනිස් වර්ගයාට ම බව ඒත්තු ගැන්වීමට ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් ඉගැන්වීම්වලින් හා සිදුවීම්වලින් තොරතුරු ලූක් තුමා තෝරා ගෙන ඇත. ඒ අනුව ලූක් තුමාගේ ශුභාරංචියෙන් ජේසුස් වහන්සේ ජුදා ජනතාවගේ පමණක් නොව මුළු මිනිස් සංහතියේ ම ගැලවුම්කරුවාණන් බව පෙන්වා දීම පරමාර්ථය කර ගනියි. මෙම අදහස මුදුන්පත් කර ගැනීම සඳහා ලූක් තුමා විවිධ කරුණු උපයෝගී කොට ගෙන ඇති ආකාරය පහත දැක්වේ.

1. මතෙව් තුමා ජේසුස් වහන්සේගේ වංශාවලිය ආදි පිතෘ ආබ්‍රහම් තුමාගෙන් ආරම්භ කරයි. එතුමා ජුදා ජාතියේ ආරම්භකයා ය. "ආබ්‍රහම්ගේ ද දාවිත්ගේ ද පුත්‍ර වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ වංශාවලිය මෙසේ ය" (මතෙව් 1:1). එහෙත් ලූක් තුමාගේ ශුභාරංචියේ ජේසුස් වහන්සේගේ වංශාවලිය ආරම්භ කරන්නේ මනුෂ්‍ය ජාතියේ ආරම්භකයා වූ ආදම්ගෙනි "ඔහු ආදම්ගේ පුත්‍රයා ය. ඔහු දෙවියන් වහන්සේගේ පුත්‍රයා ය" (ලූක් 3:23-38). මෙසේ ජේසුස් වහන්සේ ජුදා ජාතිකයන්ගේ පමණක් නොව මුළු මිනිස් සංහතියේ ම ගැලවුම්කරුවාණන් බව කීම ලූක් තුමාගේ අරමුණයි.

2. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උපතේ දී දේව දූතයන් ගායනා කරන්නේ, "මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය වේවා!" කියා ය (ලූක් 2:14). මෙහි දී මිහිපිට දේව ප්‍රසාදය ලත් ජනයා" යැයි කීමෙන් ජේසුස් වහන්සේ සියලු මනුෂ්‍යයන්ගේ ගැලවුම්කරුවාණන් බව ප්‍රකාශ වේ.

3. මෝසෙස් තුමාගේ නීතියට අනුව සෑම ජුදා ජාතික කුළුදුල් පිරිමි දරුවෙකු ම දේව මාලිගාවෙහි කැප කළ යුතු වේ. ජුසේ තුමා හා මරිය තුමිය ද ළදරු ජේසුස් වහන්සේ කැප කිරීම සඳහා ජෙරුසලම් දේව මාලිගාවට රැගෙන ගියහ. දෙවියන් වහන්සේගේ ගැලවීම බලාපොරොත්තුවෙන් සිටි දැහැමි බැතිමත් සිමියොන් නම් වූ මිනිසෙක් ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙන් පූර්ණ වී ජේසුස් වහන්සේ සිය දෑතට

ගෙන මෙසේ ප්‍රශංසා කළේ ය. "සමිඳුනි, ඔබ පොරොන්දු වූ ලෙස ම දැන් ඔබ දාසයා හට, ශාන්ති සිතින් යාමට ඔබ නිදහස දී ඇත. මන්ද, ගැලවීම මාගේ දෙනෙතින් දිටිමි. එය සකල ජාතීන් අබිමුව කළ ගැලවීම ද විජාතීන්ට එළිය දෙන ආලෝකය ද ඔබේ සෙනග වන ඉශ්‍රායෙල්වරුන්ගේ මහිමය ද වේ" යනුවෙනි (ලූක් 2:30-32). මෙසේ ජේසුස් වහන්සේ මුළු මිනිස් වර්ගයාට ම ආලෝකයක් හා ගැලවීමක් වන බව තහවුරු කරයි.

4. "මාගේ අසල්වැසියා කවරෙක් දැයි" එක්තරා විනයධරයෙක් (මෝසෙස් තුමාගේ නීතිය පිළිබඳ විශාරදයෙක්) ජේසුස් වහන්සේගෙන් ප්‍රශ්න කළේ ය. එයට පිළිතුරක් වශයෙන් ජේසුස් වහන්සේ මෙම උපමාව වදාළ සේක.

එක්තරා විනයධරයෙක් නැගිට, උන්වහන්සේ පරීක්ෂා කරමින් "ගුරු දේවයනි, සදාතන ජීවිතය හිමිකරගනු සඳහා මා කුමක් කටයුතු දැ"යි ඇසී ය. උන්වහන්සේ ද ඔහුට පිළිතුරු දෙමින්, "ව්‍යවස්ථාවලියෙහි ලියා ඇත්තේ කිමෙක් ද? ඔබ එය තේරුම් ගන්නේ කෙසේදැ"යි ඇසූ සේක. ඔහු උත්තර දෙමින්, "නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු ආත්මයෙන් ද නුඹේ මුළු වීර්යයෙන් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ දෙවි වූ සමිඳාණන් වහන්සේටත් නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න යනුයි" කී ය. උන්වහන්සේ, ඔබේ උත්තරය හරි ය. එසේ කරන්න. එවිට ඔබ ජීවත් වන්නෙහි යයි ඔහුට වදාළ සේක. එහෙත් ඔහු තමන් නිවැරදි බව දක්වන්නට කැමැති ව "මාගේ අසල්වැසියා කවරෙක්දැ"යි ජේසුස් වහන්සේගෙන් ප්‍රශ්න කෙළේ ය.

ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් මෙසේ වදාළ සේක. "එක් මිනිසෙක් ජෙරුසලමෙන් ජෙරිකෝව බලා යද්දී, සොර මුළකට අසු විය; සොරු ඔහුගේ වස්ත්‍ර පැහැරගෙන ඔහුට තලා පෙළා ඔහු අඩපණ කොට දමා යන්නට ගියහ. ඒ අතර එක් පූජකයෙක් අහම්බෙන් ඒ මග යනුයේ ඔහු දැක පාරේ අනෙක් පැත්තෙන් ගියේ ය. එසේ ම ලෙවීයයෙක් ද එතැනට පැමිණ ඔහු දැක පාරේ අනෙක් පැත්තෙන් ගියේ ය. එහෙත්, ඒ මගින් ගමන් ගත් එක් සමාරිය ජාතික මිනිසෙක් ඔහු හුන් තැනට අවුත්, ඔහු දැක, අනුකම්පා උපදවා, ඔහු වෙතට ගොස් තෙල් හා මිදියුස ගල්වා, තුවාල බැඳ, තමාගේ මෘගයා පිට හිඳුවා, තානායමට ගෙන ගොස් ඔහු බලා ගත්තේ ය. පසුවදා ඔහු රිදී කාසි දෙකක් ගෙන තානායම්කාරයාට දී මොහු බලාගන්න; මෙයට වැඩියෙන් ඔබ වියදම් කරන යම් තරමක් ඇද්ද, නැවත ආ විට මම එය ඔබට ගෙවන්නෙමි"යි කී ය. ඉදින් සොරුන් අතට අසුවූ ඒ තැනැත්තාට මෙකී තිදෙනාගෙන් අසල්වැසියා වූයේ කවරෙක් ද කියා ඔබ සිතන්නෙහි ද? "ඔහුට දයාව දැක්වූ තැනැත්තා ය"යි විනයධරයා කී ය. "ඔබත් ගොස් එසේ ම කරන්නැ"යි ජේසුස් වහන්සේ ඔහුට වදාළ සේක.

(ලූක් 10:25-37)

සමරිතානුවරුන් ජුදා ජාතිකයින් නොව අන්‍ය ජාතිකයන් ය. යහපත් සමරිතානුවරයාගේ උපමාවේ දී ඇගයීමට ලක් කෙරෙනුයේ ජුදා ජාතිකයන් නොව, අන්‍ය ජාතික සමරිතානුවරයා ය.

ලූක් තුමාගේ ශුභාරංචිය සම්පාදනය කළ කාලය ක්‍රි.ව. 80-85 අතර බව සාමාන්‍ය පිළිගැනීමයි. ලූක් තුමා ශුභාරංචියෙන් සිය පරමාර්ථය සාක්ෂාත් කර ගත්තා සේ අප ජීවිතවල අවසාන අරමුණ දෙවිඳුන් කරා ළඟා වීම බව වටහා ගෙන ජීවත් විය යුතු වෙමු. කුඩා කළ සිට ම යහපත් අරමුණු ඇති ව කටයුතු කර බුද්ධිමත් ව එම අරමුණු කරා ළඟා වීමට අදිටන් කර ගනිමු. එමගින් දෙමවුපියන්ගේ, ගුරුවරුන්ගේ හා වැඩිහිටියන්ගේ බලාපොරොත්තු ඉටු කරමු.

ජේසුස් වහන්සේගේ උපත මගින් සියලු ජාතීන්ට ගැලවීම ලැබිණි. අපි ද අපේ පවුලට හා මීසමට පමණක් සීමා නොවී සියල්ලන්ගේ යහපත වෙනුවෙන් කටයුතු කරමු.

**ක්‍රියාකාරකම**

1. ලූක් තුමාගේ ශුභාරංචියේ පරමාර්ථය කටපාඩම් කර සටහන් පොතෙහි ලියන්න.
2. ලූක් ශුභාරංචිය එම පරමාර්ථය ඉටු කර ගත් ආකාරය දැක්වීමට උදහරණ දෙකක් දෙන්න.

**ජීවිතයට බිඳක්**

***ඔබේ ජීවිතයේ යහපත් පරමාර්ථ මොනවා දැයි මෙනෙහි කර එය ඉටු කර ගැනීමට වෙහෙස වන්න.***